ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් හඳුන්වා දී ඇති වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ ජනවාර්ගිකත්වය වාර්තාකරණයට ඇතුළත් කොට ගැනීම සම්බන්ධව කරුණු කිහිපයක් සඳහන් කොට තිබේ. ඉන් එකක් වන්නේ පුවත්පත් කලාවේදියෙකු දැන දැනම හෝ හිතාමතා හෝ ජනවාර්ගික අසමගියට හෝ ප්‍රචණ්ඩත්වයට අනුබල නොදිය යුතු බවයි. එසේම යම් අයෙකුගේ වාර්ගිකත්වය පුවතට සෘජුවම අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙ වැළැකිය යුතු බවද එහි සඳහන් වේ. එය එසේ වුවත්, ශ්‍රී ලංකාවේ ඇතැම් ජනමාධ්‍ය මෙම ආචාර ධර්මයන් කඩ කරනා අවස්ථාවන් නිරීක්ෂණය කළ හැක.

2018 වසර සහ 2019 වසර දෙක තුළ තෝරාගත් සිංහල භාෂා පුවත්පත් කිහිපයක් මගින් උක්ත ආචාර ධර්මයන් ද්විත්වය කඩ කොට ඇති අවස්ථාවන් ප්‍රමාණය පහත ප්‍රස්තාරගත කොට ඇත. අප විසින් මෙම වසට කිහිපය තුළම මෙම ආචාර ධර්මයන් ජනමාධ්‍ය විසින් කඩ නොකළ යුතු බව පෙන්වා දුන්නෙමු. එම ආචාර ධර්ම උල්ලංඝනයන්ගේ යම් කිසි සමස්ත අඩුවීමක් 2018 වසර හා සසඳන විට 2019 වසර තුළ දක්නට ලැබේ. එනමුත් පුවත්පත් වෙන් වෙන්ව ගත් විට එය පුවත්පතෙන් පුවත්පතට වෙනස් වී ඇත.

මෙම ආචාර ධර්මයන් ද්විත්වය ජනමාධ්‍ය මගින් පිළිපැදීමේ වැදගත්කම වන්නේ, බහුවාර්ගික රටක් වන අප රට තුළ වාර්ගිකත්වය පදනම් කරගනිමින් ඇතිවන කොන් කිරීම් සහ වාර්ගික අසමගිකම් ඒ ඔස්සේ අවම කරගැනීමට දායකත්වයක් ලැබෙන නිසායි. වගකීම් සහගත මාධ්‍යකරණය නම් එයයි.

#MediaEthicsSL #lka #SinhalaPress #Ethnicity #Discrimination #EthnicDiscrimination #Divaina #Lankadeepa #Mawbima #Silumina #Dinamina